# සම වයස් කණ්ඩායම් මගින් පවත්වනු ලබන ඉගෙනුම් සැසි හරහා විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කාර්ය සාධනයට කරනු ලබන දායකත්වය : රුහුණ විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය ඇසුරින්.

*මාධවී රත්නායක[1], හිරුක්ෂි තුෂාරිකා[2]*

විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් අතර සම වයස් මිතුරන් විසින් මෙහෙයවන ඉගෙනුම් සැසි සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයට දායක වන ආකාරයේ පිළිබඳ මෙහිදී අධ්‍යයනය කර ඇත. කොරෝනා වෛරසය හේතුවෙන්ද, ආර්ථික අර්බුද හේතුවෙන්ද මාර්ගගත ක්‍රමයට නැඹුරු වීම නිසා ඉගෙනුම් සැසි වලට සහභාගි වන්නන්ට විභාග කටයුතුවලට සාර්ථකව මුහුණ දීමට ඉගෙනුම් සැසී ප්‍රගතිශීලී දායකත්වයක් ලබාදී ඇත.මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ සමවයස් මිතුරන් විසින් මෙහෙයවන ඉගෙනුම් සැසි මගින් උපාධි අපේක්ෂක සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනයට කෙරෙන දායකත්වය අවබෝධ කර ගනිමින් ඉගෙනුම් සැසි මඟින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීමයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය සඳහා නියැඳිය තෝරාගනු ලැබුවේ රුහුණ විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ තුන්වන ස්ථලයේ සිසුන්ගේ සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ සිසුන් 75 ගෙනි. දත්ත ලබා ගැනීමට මාර්ගගත ක්‍රමය භාවිතා කරන ලදී.සිසුන්ගෙන් 70.66% මාර්ගගත ක්‍රමය හරහා ඉගෙනුම් සැසි වලට සහභාගි වී ඇති අතර 29.34% භෞතික සැසි සඳහා සහභාගී වී ඇත. ඉගෙනුම් ඵලදායිතාවය සම්බන්ධයෙන් ගත් කල සහභාගී වූවන්ගෙන් 94.66% ප්‍රතිශතයක් යම් මට්ටමක ප්‍රගතියක් වාර්තා කළ අතර 49.33% ඔවුන්ගේ කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති කළ බව පෙන්නුම් කර ඇත.මීට අමතරව 96% ප්‍රමාණයක් මෙම සමවයස් ඉගෙනුම් සැසි හරහා තම ශ්‍රේණි වැඩිදියුණු වී ඇති බව තහවුරු කර ඇත. විෂය කරුණු අවබෝධය පිළිබඳ සැලකීමේ දී සිසුන්ගෙන් 69.33% මධ්‍යස්ථව තහවුරු කරනු ලැබුවේ සම වයස් ඉගෙනුම් සැසි තනි තනිව ඉගෙනීමට වඩා ඵලදායි බවයි. 28% ප්‍රමාණයක් ඒ බව දැඩි ලෙස තහවුරු කර ඇත. ඉහළ ස්ථලවල සිසුන්ගේ උපදෙස් හා සහභාගි කරවාගැනීම් ඉහළ නැංවීම, ඉගෙනුම් සැසි විභාග කාලවලට පමණක් සීමා නොකිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය ඉහළ නැංවීම ඉගෙනුම් සැසි මගින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයන් ලෙස හඳුනාගත හැක. මේ සඳහා ස්කී, එදදාකැ වැනි මෘදුකාංග යොදා ගැනීම මගින් ඉගෙනුම් සැසි වඩාත් සාර්ථක කර ගත හැක.මෙම සොයා ගැනීම මගින් පෙනී යන්නේ සම වයස් මිතුරන් විසින් මෙහෙයවන ලද ඉගෙනුම් සැසි ඉතා ඵලදායි වන අතර, එහි විභවය සම්පූර්ණයෙන්ම උපයෝගී කර ගැනීමට වඩා හොඳ සම්බන්ධීකරණයක් සහ ව්‍යුහයක් අවශ්‍ය වන බවයි.

**ප්‍රමුඛ පදඃ** අධ්‍යයන කණ්ඩායම්, ඉගෙනුම් සැසි, මාර්ගගත ක්‍රමය, සමවයස් මිතුරන්, ඵලදායිතාවය

[1] ආර්ථික විද්‍යා අධ්‍යනංශය. helpresearch20@gmail.com

[2] රුහුණ විශ්ව විද්‍යාලය